# රාත්‍රී උත්සව අවස්ථාවක් සඳහා සාරියක් පින්තාරු කර ගනිමු



**පින්තාරුව සඳහා අවශ්‍ය ද්‍රව්‍ය**

සිල්ක් පේන්ට් දම්බුරු සහ සුදු / මදර් ඔෆ් පර්ල් ඩස්ට්/ සැප්ලෝම්
බෝඩ් එකක් /පොලිතින් /නො:4 පින්සල්
රන් සහ දම්බුරු පැහැති සීකුයින්ස් /ගෝල්ඩ් ග්ලිටර් අවුට්ලයින්
සීකුයින්ස් අලවන ගම් එකක් / දම්බුරු පැහැති අවුට්ලයින්

**නිර්මාණය කර ගන්නා ආකාරය.**

මුලින් ඔබට පින්තාරු කිරීම අවශ්‍ය මෝස්තරය කොලයක් මත ඇඳගන්න. පසුව එය සැප්ලෝම් බෝඩ් එකක් මත තබා අල්පෙනිති රඳවාගන්න. අල්පෙනිති රඳවාගත් මෝස්තරය වැසෙන ලෙස පොලිතින් එකක් දමා ඒ මත පින්තාරු කිරීමට අවශ්‍ය සාරි රෙද්ද එලා ගන්න. මෙම පින්තාරුව සඳහා උපයෝගි කරගෙන ඇත්තේ ලේසර් යන සාරි වර්ගයයි.

පින්තාරුවේදී සාරිරෙද්ද එහා මෙහා නොයන ලෙස සාරියමත නැවත අල්පෙනිති ගසාගන්න. පසුව නො: 4 පින්සල ආධාරයෙන් අපට අවශ්‍ය කොටස් තද දම්බුරු සහ ලා දම්බුරු පැහැයෙන් වර්ණ ගන්වා ගන්න. (ලා දම්බුරු සාදාගනු ලබන්නේ සුදුපැහැයට දම්බුරු මිශ්‍ර කිරීමෙනි.) මෙයට දිස්නයක් එක් කිරීමට අවශ්‍ය නම් පමණක් මේ අවස්ථාවේදී ඔබට මදඔෆ්පර්ල් ඩස්ට් එකතු කළ හැක. පසුව එය පැය හයක් හොඳින් වේලා ගන්න. පැය හයකට පසුව මෝස්තරය වඩාත් ඉස්මතු කර පෙන්වීමට දම්බුරු පැහැති අවුට්ලයින් මෝස්තරය වටේ යොද ගන්න.



මෙම මෝස්තරයේ කලු සහ දම්බුරු වර්ණවලට වඩාත් ගැලපීමක් ඇති වර්ණය ලෙස රන් පැහැය යොදාගත හැකි බැවින්, ගෝල්ඩ් ග්ලිට අවුට්ලයින් මෝස්තරයේ සමබරතාවයට හානි නොවන අයුරින් තැන තැනට යොදා ගන්න. ඒ ලෙසම රන් පැහැති සහ දම්බුරු පැහැති සීකුයින්ස් යොදා ගනිමින් මෙය රාත්‍රී උත්සව අවස්ථාවකට උචිත වන ආකාරයට ගලපාගැනීමට ඔබට හැකියාව ලැබේ.

සාරියේ පොට කොටසේ වැඩිපුර මෝස්තරය විහිදී ඇති බැවින් සහ අනෙක් කොටස් ඉතා චාම්ව බෝඩරයක් ආකාරයට පමණක් විහිදී ඇති බැවින්, (සාරියේ මැද වැඩදමා නොමැති බැවින්) මෙය ගුජරාටි ක්‍රමයට ඇඳීම තුලින් මෝස්තරයට වඩාත් සාධාරණයක් ඉටුකරයි.

සාරියේ පහළ රැලි තබන කොටසේ මෝස්තරය උඩට විහිදෙන ආකාරයට සකසා ඇති බැවින්, සිරුරේ උස වැඩිකර පෙන්වීම සඳහා එය ඉවහල් වේ. මෙය සැප්ලෝම් බෝඩ් එකෙන් නැවත ගලවා ගන්නා තත්වයට පත්වීමට නම් පැය 02 ක කාලසීමාවක් වේලාගත යුතුයි.

හැඩගැන්වීම සහ
සාරි පින්තාරුව

ප්‍රවීන රූපලාවන්‍ය
සහ අත්කම්
නිර්මාණ ශිල්පිනී,
**නදීකා පෙරේරා** -

